# කවිපිටුව



## අහිමි පෙම

ආදරයේ රන් විමන් තනන්නට
උයන් කොනක සිට පෙම් බස් දෙඩුමට
රෑ ආකාසේ තරුමල් ගෙතුමට
තවම හිඳිමි මම ඔබම පතාගෙන

දෙව්ලිය සිරි රූ සෝබා දුටුවා
උයනේ පිපි මුදු කොමලිය වූවා
තරුකැට අතරේ පුන්සඳ වූවා
මහදේ නෙක බිතු සිතුවම් ඇඳුණා

හද සැනසූ රූ සෝබා මැකුණා
උයනේ පිපි මල් පරවී වැටුණා
අමාවකට සඳ ළංවනු පෙනුණා
ඇඳි සිතුවම් බොඳ වී යනු දැනුණා

මාගේ ලෝකේ රැජිනිය වීමට
රන් විමනට කැන්දා ගෙන ඒමට
මා මැව් විමනේ අබිසෙස් ලැබුමට
තවම හිඳිමි මම ඔබම පතා ගෙන

**ආර්. එච්. අයේෂා සන්දීපනී**

## ලංකා පොකුණ

ලංකාවේ හැඩය ගත් පොකුණක් ය උයන් තෙර
ඈ සමඟ පෙම් සිහිනයක් දුටුව තැනකි මේ
ඒ කිසිදු දිනෙක අප නොදුටු දසුනක් ය අද
පුතු ගෙ අත ගෙන පැමිණ විඳින්නේ මා මෙතන

පොකුණ මැද වතුර මල පිහිටි සමනොළ ගිරෙන්
නො විසිරේ මල් වතුර සිව් දිගට සම විල
පල් වතුර සැදූ සෙවළෙ විල් මහනෙලක් පමණි
නව දියක් ඉල්ලමිනි සියල් සලකුණුම මෙහි

දණ වටක් බැස දියේ පොකුණ සෝදයි යමෙක්
නාදන් ය ඔහු තවම සේවකය උයනෙහිම
රිවි තැවුලෙ මැළ මලක් මා පුතුට ගෙනත් දී
ඒ සිනාවෙන් තුටු ව උරයි ඔහු බීඩියක්

වැඩි දැනුම ඇවැසියෙන් පුතු ගෙ පාසල් වැඩට
ලංකා සිතියම දකින සැරිසරකි පොකුණ වට

බොකු කලපු ළඟ අහෝ ! දුක් ගෙන ය සුදු කොකුන්
වරින් වර අහස් විමනින් බසිති පිළිහුඩුන්
නාගදීපෙට ඇදෙන දිය නයෙකි යාපනේ
ගෙඹි වීර ගී ඇසෙයි දිවි ගැලව ගඟ දෙසින්

තාත්තේ ! තාත්තේ ! අපි දිනූ තැන කොතැන
හමුදාවේ මාමලා කොටි නැසූ තැන කොතැන
කලපුවේ ඔබ ඔබා කොඩි ගැසූ තැන කොතැන
විමසමින් පුතු සොයයි නන්දිකඩාල් ලකුණ

අතරමං වී සෙදින් බැලුණි වටපිට එවිට
ඒ දෙස වෙත සුරත පෑ නාදන් ය පොකුණ මැද
සියල් ආගම් පිදෙන සාදු සමනොළ බඳෙහි
කළු සෙවළ සූරමින් ඔහු තවම පොකුණෙ වැඩ

**සුමින්ද කිත්සිරි ගුණරත්න**
**2013 පළ කරන ලද**
**"ලංකා පොකුණ"**
**කාව්‍ය සංග්‍රහයෙනි.**

## අව්‍යාජත්වයේ විලාපය

මගේ නෙතු ..
මගෙන් සොරා ගෙන
ඇරයුම් කරයි
පවනින්
එන්න
විඳගන්න
පරිසරයේ සොඳුරු බව
පවසන්න
මා ගැන අව්‍යාජ ව
මුළු ලෝකයා හට
හදවත දිව යයි
නුඹ වෙතට
එක්තරා සීමාවක්
හමුවන තුරු ම
නමුත්
සමාවනු මැන පවන
මේ ගත සිත අවිවේකියි
Widowsless
Rectangle සෙමෙස්ටරයක
කාලය නැත
ඔබ මා අතර
පිළිසඳරකට
අතීත කවි-කිවිඳියන් මෙන්
අව්‍යාජ ගී පබැඳීමට
මන්ද
මා
වත්මන් සරසවි පොත් ගුල්ලෙක්
වූ නිසා ම

**පී. එම්. එම්. ශානිකා**

## දෑවැද්ද

සුදු පිරුවටක් වන්
නිකැළැල් මලක
නො ඉඳුල් බව
පරපුරක අබිමන්
දෝතින් දරන්නී
ඈ
සැදු දෙගුරුන් බලෙන්
ලෝකය බැලූ
පුදා කිරිකඩ සේලය
හතර වරිගය අබියස
වැදූ මව් පුදන්නී
මලක් සේ රැකි
පියාණන් පුදන්නී
අබිසෙස් ලබන්නී
ඈ
එය ම ය දායාදය
ඈ ලද
ගුණ සුවඳ සමඟ
පුරන්නට සොඳ පතිදම්
කුල ගෙයක

**හසිකා අනුරුද්ධි බණ්ඩාර**

## ඉතින් නුඹ ම පැමිණෙන්න

නීල මිණි පරයන සුසුදු මුදු හද නුඹේ
නවාතැන සෙනහසේ අහිංසක වත නුඹේ
පැවසූ වදන් වැල් ශෛලමය පුවරු සේ
සදා මා සිතේ රැඳි පියකරුම ගත නුඹේ

ඈත ක්ෂිතිජය දුරක පහන් තරුවක් ලෙසේ
නුඹ නගන මදහාස මසිත සනසයි තොසේ
බිඳෙන් බිඳ මතක පියුමක් නැගී සිනා සේ
මසිත නිති පුබුදුවයි පිපෙන කුමුදක් ලෙසේ

තරු රටා විසුරුවන ගගන තල නිදහසේ
නුඹේ රුව සනසවයි මහද තරුවක් ලෙසේ
දිලෙන මිණි මුතු මතින් පිය නගා සන්තොසේ
ඉතින් නුඹ පැමිණෙන්න මසිත සනසා මෙසේ

**ලක්ෂිකා දිසානායක**

## අලුත් දැහැන

සිඳුණු වියැකුණු
බිඳුණු අතීතයේ
නැවතුමක තනිවෙලා
අලුත් දැහැනට සම
වදින්නට ලැබුණා
සැරසුණා හුරු වුණා
සිනහවෙන් සතුටෙන්
නැගුනු නැගෙන
කඳුලු තෙරපන්න
වසන්තයක් ඇවිදින් ද
මැලවුණු ගත පුබුදා
ජීවිතය විඳින්නට
කියා දෙන්න

**ඩබ්. සී. පී. සිල්වා**

## කුස-පබා

සඳවත පැහැදිලෙන ඔබ වත
දුරින්හිඳ බල බලා සැනසෙන
ඔබ දෙපා මුල දාසකම් කළ
කාල කුස රජ මම ම වන්නෙමි

තෙදැති ඔබ රුව මඬල නැතිවට
ඔබේ හදපිරි රූ බලන්නට
කලක් ගත වුණි මෙමට
ඔබේ පබවත මම ම වන්නෙමි

**එම්. ජී. නදීෂා ජීවන්ති කුමාරසිරි**

PERMANENT REFERENCE
Sabaragamuwa University Library

## අම්මා යනු වැදූ මව් ද හැදූ මව් ද

හීතලට වෙව්ලන දෑඟිලි අතර	මැද
ළැම මත හොවා ගෙන උණුසුමින්	තද
රජ මැදුරක රන්තොටිල්ලක් නො	වුවද
අහිංසක මගේ ළය ඔබට සුව ගෙනේ	විද

වේලක්වත් නොකා පපුතුරේ උනනා	කිරට
හෙමින් ළං කරන ඔය වේලුණු දෙතොල්	පට
ගැහෙන පපුවේ බිඳක් නැරම	ලෙයට
ඉතිර යයි කිරි පුතේ නුඹේ කිරිකැටි	කමට

මගේ කුසින් වදන්නට පිනක් මට නැති	වුවද
නුඹේ මව් හැර ගියේ නුඹව මොන	හිතකින්ද
නො තේරෙන හිනා දැක සිතේ ගිනි	ඇවිලුන ද
මහ එවුන් ගේ පවට නුඹ කුමක්	කරන්නද

අවජාතක ලෙසින් ඉපිද ආ	නිසාවට
මහමඟම හැර ගියා ඔබෙත් පෙර තිබූ	පවට
කුසින් වැදුවේ නැතත් ගලා ආ	සෙනෙහසට
කිරුළු මට ලැබේවි ද හිඟන මා මව්	ලෙසට

**එල්. සෞම්‍යා**

## නිහඬ සිතුවිල්ල

නෙතු පියන් වසා මම
ඇවිද ගියෙමි අඳුරු ලොවකට
පහන් සිළුවක
සැලෙන දැල්ලක
ආලෝකය විහිදුණා දසත
ස්පර්ශ කළ හැකි ද?
නොහැක
අනතුරකි එය
මන්දයත්
අළු පුපුරක් වුවද
ගෙන ඒවි විනාශය
පහන් සිළුවකට එය
කෙතරම් නම් පහසුද ?
හඬ අවදි නොවන
නිසල සිතුවිලි
තවමත් අළු පුපුරක් ලෙස
සැඟව ඇත
යටි සිතක
වෙර දරමි කිසි දිනෙක
නොදල්වන්නට
වෛරයේ පහන් සිළු ම සිත
නැණ පහන් මිස

**ඩී. පී. නිශාමි කෞශල්‍යා රණසිංහ**

## නොනිම් පෙම

කෙලෙස සම කරන්නද
චණ්ඩ හිරු රැස්කඳට
රශ්මියෙන් දාහයෙන්
ගත ගිලන් කරනවා

කෙලෙස සම කරන්න ද
සොළොස් සඳ පිරි රැයට
අමාවක දිනට සඳ
ලොව අඳුරු කරනවා

කෙලෙස සම කරන්න ද
සමුදුරේ රැල්ලකට
ළඟට ආවත් යළිත්
ක්ෂිතිජයට රැලි දුවනවා

පන්හිඳෙන් ලියවුණත්
නොයෙක් උපමා නුඹට
නුඹේ සෙනෙහස් සිසිල
එයට වැට බඳිනවා

සිත නිවා සනසවන
හදට සෙනෙහස පුදන
හදේ ගැඹුරුම තැනින්
නුඹට පෙම් කරනවා

**ඩී. සී. චාරුණි ජයතිස්ස**

## සයුර වෙත

සයුර ඔබ
සිත් සතන් පුබුදුකර
කවි ජනිත කළ නමුදු
මගේ පැල උදුර ගෙන
ඇඳිවතම ශේෂ කළ

සයුර ඔබ
විදා හළ නිල් දෑත
මගේ උන් උදුර ගෙන
උරුම දී මරු තුරුළ
ශේෂ කළ මා දිවිය

සයුර ඔබ
එපා මට කිසි දිනෙක
මුළු දනට සිඳු පෙම ද
මගෙ ලොවට කඳුළැලි ද
උරුම කර සිනාසෙන

**පී. ඩී. උදේශා කාන්ති**

## නිශා කල හමුව

අළු පැහැ සයුර
හිරු හා සමඟ මුසු වී
ඈත ක්ෂිතිජය
ගිල ගනිත් දී

කසාවත් අඩසඳ
තාරකා දරු කැළත්
පිරිවරා ගිනිමින්
ගුවන් ගැබ සිසාරාත් දී

අලුයමේ කැදැල්ලෙන්
නික්ම ගිය කුරුල්ලන්
නැවත තම කැදලි වෙත
හනි හනික පියඹත් දී

විසල් බෝ ගසේ දලු
සැදෑ සුළගේ නැහැවෙමින්
වවුලන් ගේ නිවහන
අපූරුවට සකසත්දී

අඳුර හනිකට අවදි වී
දහවල නින්දට සමුදෙත්දී
නිශා කල හමුව කෙතරම් අපූරු ද

**එච්. හිරෝෂිණී කාමනී**

## සීතල ද කඳුළු මේ තරම් ?

පිපී හෙල්වැටි තැනිතලාවේ
සුපිපි කුසුමන් හිනැහුනාවේ
සරත් නිලඹර රඟන සුළඟේ
රැගත් නුඹ හඬ මුසුවුණා වේ

සැඟ ව සෝදුක් ගලන ගඟුලේ
නුඹේ වුවනත සැඟවුණා වේ
ඉනු කඳුළත් වැටෙන මොහොතේ
මගේ නෙත් යුග බොඳ වුණා වේ

වසත් ගගනත දිලෙන තරුවේ
හදේ කැලුමන් මත් කළා වේ
සියොත් කැළ ගැයූ ගීත රාවේ
ලෙසේ ඔහු මා හැර ගියා වේ

**ශශිකලා දේවි දිසානායක**

## යාචකයා

පදික වේදිකාවේ
කොනක හිඳගෙන
වණවූපය දිග හැරගෙන
කළු ගැසුණු අත්ල දිගු කර
යදියි නුඹ
සිඟමන්

මාසේ පඩි තවම නැත
ගෙදර අගහිඟ පිරී ඇත
බස් ගාස්තුව පමණක්
පසුම්බියේ ඉතුරුව ඇත

ඉදින්
නුඹේ අත්ලට
කෙසේ කාසි දමන්නද මා

අත නො පෑවත් කෙනෙකුට
මා ද නුඹට ම සමාන
යාචකයෙකි

**එන්. එස්. එස්. ගුණතිලක**

## තටු අහිමි කිරිල්ලිය

ඉගිලෙන්නට
පියාපත් නොලද මුත්
ඔබගේ සිත් ගැබෙහි පියැඹූ
පුංචි කිරිල්ලිය
මම වෙමි
තටු කඩා දමා
එක්තැන් කළ පසු
ඔබ සෙවණෙහි
පිහිට විනා,
අන් සෙවණක්,
තිබිය හැකි ද මට

**ඩී. එම්. අයි. මධුෂාණි**

## අප්පච්චි

කෙකටිය යායේ පින්න විසුල කර
හිරුට හොරෙන්
කෙතට හිනාවෙන අප්පච්චි
පිටවානට දුක කියලා
අහස් ගැබෙන් වැසි යදිනා
අප්පච්චි

දිවියම දිය වූ සින්න ඉඩම ගැන
මුවඟින් නො දොඩා රෑ සක්මන් බිම
නුඹ ඇහිඳින්නේ
අහිමි පනම්දැයි
කියා දෙන්න මට
අප්පච්චි

ඉලුක් හෙවණ යට
මැදුරක නැති සුව
නිල්ල පිරූ මගේ අප්පච්චි
මතුත් මගේ කෙත
පුන් කළස් නො වේ මට
දියපහස නුඹයි මගේ
අප්පච්චි

**දිලානි එන්. විතානගේ**